www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# බංකොලොත් වීමෙන් ගැලවීමට ශ්‍රී ලංකා ආන්ඩුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් නයක් පතයි

**Sri Lankan government seeks IMF bailout**

**තුසිත සිල්වා හා සමන් ගුනදාස**
**2009 මාර්තු 17**

අතිශය නරක අතට හැරෙමින් පවතින විදේශ සංචිත හිඟයකට මුහුන දෙන ශ්‍රී ලංකා ආන්ඩුව බංකොලොත් බාවයෙන් ගැලවීමට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් (ජාමූඅ) ඩොලර් බිලියන 1.9 ක දැවන්ත නය මුදලක් ඉල්ලුම් කර සිටියි. අපනයන ඉපයීම් කඩා වැටීම, විදෙස් ආයෝජකයින් ඉවත්ව යාම සහ රුපියල අවප්‍රමාන වීම වලක්වා ගැනීමට මහ බැංකුව විසින් ඩොලර් මිලියන ගනනක් යෙදවීම හේතුවෙන් දිවයිනේ විදෙස් සංචිත, පසුගිය ජූලි මස ඩොලර් බිලියන 3.5 සිට දෙසැම්බර් මාසයේ දී ඩොලර් බිලියන 1.7 ක අවමයකට කඩා පාත් විය.

නැගී එන ආර්ථිකයන් අතුරින් නරකම තත්වයන්ගෙන් එකක් සලකුනු කරමින් දෙසැම්බර් මස ගනන් හිලව්වලට අනුව විදෙස් සංචිත ප්‍රමානවත් වන්නේ හරියටම මාස එක හමාරක අපනයනයන් වලට වියදම් කිරීමට පමනි. පසුගිය මාසයේ දී ෆිච් රේටින් ආයතනය ලංකාව පිලිබඳ තමන්ගේ අගැයීම ඍන අගයට පහත හෙලූ අතර, රුපියල අවප්‍රමාන කිරීමකින් හෝ ආනයනයන් අඩු කිරීමකින් තොරව ජංගම ගිනුම් හිඟය පියවීමට මුදල් සිඳීයා හැකි බවට අනතුරු අඟවා සිටියේය.

ආන්ඩුවේ සහ මහබැංකුවේ නිලධාරීහු විසින් රටේ පවතින අඩමාන ආර්ථික තත්වය මංමුලා සහගත ලෙස සැඟවීමට උත්සහා දැරූහ. ජාමූඅ ලංකාව වෙත නය ලබා දීමට එකඟ වූ බවත් මොනයම්ම හෝ සැලකිය යුතු කොන්දේසි මාලාවකින් තොරව එය ලබා දීමට කැමති වූ බවත් මහබැංකු අධිපති අජිත් කබ්රාල් පවසා සිටියේය.

මාර්තු 15 ආන්ඩුවේ ඉරිදා ඔබ්සර්වර් පුවත්පත සමඟ පැවැති සම්මුඛ සාකච්ඡාවකදී , ''මෙම තැතිගන්වන ආර්තික කතාන්තර බොහොමයක් නිර්මානය කර ඇත්තේ අපගේ රට අස්ථාවර කිරීමට තමන්ට හැකි ඉහලම දේ කරන අතරේ අස්ථාවර රටක් සහ අසමතුලිත ආර්ථිකයක් දැකීමට ප්‍රාර්ථනා කරන මිනිසුන් කන්ඩායමක්'' යැයි කබ්රාල්, විවේචකයින් වෙත කඩා පැන්නේය. එවැනි තර්ජනයක් ආන්ඩුව විවේචනය කිරීම හේතුවෙන් මාධ්‍යවේදීන් සිරගත කොට මරා දමන රටක හුදු කටමැතයකට වැඩි දෙයක් ගැබ් කර ගනී.

ජනාධිපති මහින්ද රාජපක්ෂ තමන් ජාමූඅ වෙත සිගමනේ යාම හා එහි නව උග්‍ර කොන්දේසිවලට එකඟ වීමට සිදුවීම යන ප්‍රකාශනයන් පිලිබඳව විශේෂයෙන්ම සංවේදීය. දැනටමත් ආන්ඩුව ලෝක ආර්ථික අර්බුදයේ බලපෑම සහ ආන්ඩුවේ දැවන්ත යුද වියදම්වල විපාක ලෙස උග්‍ර ලෙස නරක අතට හැරෙන ජීවන මට්ටම් පිලිබඳ වැඩෙන මහජන වෛරයකට පාත්‍ර වී සිටී.

අයැදුම් කර සිටින ජාමුඅ නය මුදලේ ප්‍රමානය පෙර නුවූ විරූ තරම් එකකි. එනම් ජාමූඅලේ ශ්‍රී ලංකාවේ සලාකය මෙන් තුන් ගුනයකි. ජාමුඅ කන්ඩායමක් මාර්තු මුලදී මහ බැංකුව සමඟ රැස්වීමක් පැවත්වූ අතර එම මාසය අගදී තීන්දුවක් සමග කොලඹ දී මුන ගැසීමට නියමිතය.

ආන්ඩුව මංමුලා සහගත අයුරින් නය යදින බවට සැකයක් ඇත්තේ නැත. විදෙස් ආයෝජකයින් මහබැංකු බිල්පත් වලින් ඉවත් වී යාම නිසාවෙන් 2008 දෙවන අර්ධයේ දී ඩො.මිලියන 600ක දැවන්ත ඉවත ගලා යාමක් සිදුවූ බව ආන්ඩුවට අයත් ප්‍රතිපත්ති අධ්‍යන ආයතනයේ ජ්‍යෙෂ්ට ආර්ථික විද්‍යාඥ දුෂිනි වීරකෝන් මාධ්‍යයට ප්‍රකාශ කර සිටියාය. විනිමය බිඳ වැටීමෙන් වලක්වා ගැනීමට 'ඉසිලිය නොහැකි හුවමාරු රේට්ටු ක්‍රියාමාර්ගයක් ' ආරක්ෂා කරගැනීමට මහබැංකුව සැප්තැම්බර්- නොවැම්බර් අතර මාසයේ දී ඩොලර් මිලියන 200ක් පොම්ප කලේය. මෙම පරිශ්‍රමයන් තිබියදීත් , පසුගිය ඔක්තෝබර් මස සිට රුපියල සියයට 6ට වැඩි ප්‍රමානයකින් අවප්‍රමානය වී ඇත.

රටේ ජංගම ගිනුම් හිඟය 2007 වසරේ ඩො.බිලියන 1.5 සිට 2008 වසරේ ඩො.බිලියන 3.6 දක්වා එනම් දල ජාතික නිෂ්පාදනයෙන් සියයට 8.8 දක්වා ප්‍රසාරනය වූවේය. මෙම වර්ධනය සඳහා ප්‍රමුඛ හේතුව අපනයන ආදායම පහත වැටීමත් සමග එක්වූ ඩො.බිලියන 14ක දැවන්ත ආනයනයන්ය. ගනන් හිලව් හෙලිදරව් නොකරත් , අපනයන බිලෙන් සැලකිය යුතු කොටසක්

වැය කර ඇත්තේ පාකිස්තානය, ඊශ්‍රායලය, චීනය සහ රුසියාව වැනි රටවලින් ආන්ඩුවේ පුලුල් අවි මිලදී ගැනීම්වලටය. 2006 ජූලි මස රාජපක්ෂ විසින් යුද්ධය යලි ආරම්භ කිරීමෙන් අනතුරුව යුද වියදම් 2006 වසරේ රුපියල් බිලියන 96 ( ඩො.මිලියන 840 ) සිට 2008 වසරේදී රුපියල් බිලියන 200 දක්වා පිම්මක් පැන තිබේ.

තෙල් ආනයන වියදම සැහැල්ලු කරමින්, 2008 වර්ෂයේ දී තෙල් මිල තියුනු ලෙස පහත වැටුනි. කෙසේ වෙතත් ෆිච් රේටින් ආයතනය සිකුරාදා දින පැහදිලි කර සිටි ආකාරයට ඃ ''ජාත්‍යන්තර තෙල් මිල මෑත මාසවලදී පහත වැටුන අතර, එය ශ්‍රී ලංකාවේ වෙලද හිඟය අඩු වීමටත් බලපෑවේය'', එහෙත් දැවන්ත බාහිර නය යලි පියවීම සහ අනෙකුත් ප්‍රාග්ධන යෙදවුම් නිසාවෙන් ''මෙය නිල සංචිතයන්ගේ නියත පහල වැටීම වලක්වන්නේ නැත''. රේටින් ආයතනය විසින් අනාවැකි පලකර ඇති ආකාරයට 2009 වර්ෂයේ වර්ධන රේට්ටුව සියයට 3.2 ක් එනම් නිල ඇස්තමේන්තුව වන සියයට 5.5ට වඩා, සැලකිය යුතු අඩුවීමක් සටහන් කරනු ඇත.

පෙරදී ආන්ඩුව ජාත්‍යන්තර මුදල් වෙලද පොලේ නය ගත්තේ යුද්ධයට මුදල් යෙදවීමටය. මුදල් සොයා ගැනීම සඳහා සිංහල විදෙස් සංක්‍රමනිකයන්ට යුද බැදුම්කර ඩොලර් මිලියන 500ක් විකිනීම සහ ලෝකයේ අනෙකුත් රටවල් සමඟ විනිමය හුවමාරු ඉහල නංවා ගැනීම කල යුතු බවට පෙබරවාරි මාසයේදී, රාජපක්ෂ නිවේදනය කර සිටියේය. එහෙත් ඒ එකක්වත් ප්‍රමානවත් ප්‍රතිඵල ලබා දී නැත. දුෂිනි වීරකෝන් ඒසියා ටයිම්ස් වෙබ් අඩවියට පැවසූ ආකාරයට, '' අභ්‍යන්තර සහ ජාත්‍යන්තර නය වෙලද පොලවල් වලින් අපට තව දුරටත් නය ලබා ගත නොහැකිය '' .

ජාමූඅ නය, කොන්දේසි මාලාවකින් තොරව පැමිනෙනු ඇතයි යන ආන්ඩුවේ කියා පෑම් විචාරකයින් විසින් නොතකා හරියි. උදාහරනයක් වශයෙන් මාර්තු 15 ඉරිදා දින සන්ඩේ ටයිම්ස් පුවත්පතට අනුව , ''ජාමූඅ, ආන්ඩුව විසින් සම්පූර්න කල යුතු වන කොන්දේසීන් පනවනු ඇත. මේවා අදාල වනු ඇති ක්ෂෙත්‍රයන් වනු ඇත්තේ ඃ හුවමාරු රේට්ටුව, නිශ්චිත කොටසක මත වන වියදම්, සෑම ආකාරයේම ආන්ඩුවේ වියදම් සහ රාජ්‍ය මූල්‍ය හිඟය යනාදියටය. යහ පාලනය පිලිබඳ කාරනාවන්, ප්‍රතිසංස්කරන පිලිබඳ ක්‍රියාවලීන් සහ ඇතම් මහජන ව්‍යාවසායන් පෞද්ගලීකරනය කිරීම දක්වා කොන්දේසීන් තවදුරටත් පුලුල් විය හැක''.

පසුගිය වසර අවසානයේ පාකිස්ථානය ජාමූඅන් හදිසි නයක් ලබා ගත්තේය. කොන්දේසි වලට ඇතුලත් වූයේ ඃ බල ශක්තිය, පෙට්රල් නිෂ්පාදන සහ පොහොර මත වන සියලු ම සහන අහෝසිකර දැමීම ඃ සේවා නියුක්තිකයන් සිය දහස් ගනනක් දොට්ට දැමීමෙන් ආන්ඩුවේ වියදම් කපා දැමීම සහ බදු ඉහල දැමීම යනාදියයි. රාජ්‍ය මූල්‍ය හිඟය කපා දැමීමටත්, රාජ්‍ය අංශයේ සේවක පිරිස් කප්පාදු කිරීමටත් , මිල සහනයන් අවම කිරීමට සහ පෞද්ගලීකරනය ක්‍රියාවේ යෙදවීටත්, ජාමූඅ සහ ලෝක බැංකුව විසින් ශ්‍රී ලංකා ආන්ඩුව වෙත ඊට පෙරාතුව කැදවුම් කරනු ලැබ තිබේ.

දැනටමත් ආන්ඩුව ජාමූඅහි පීඩනයට යටත් වීමේ ලකුනු පෙන්නුම් කර තිබේ. පසුගිය බ්‍රෘහස්පතින්දා භාන්ඩාගාරය විසින් පලාත් සභාවන් වෙත නිකුත් කල චක්‍රලේඛයකින් අන කරසිටියේ, ආන්ඩුවට ඔවුන්ගේ වැටුප් නොගෙවීමට නොහැකි බැවින් කිසිසේත්ම අලුත් සේවකයින් පලාත් සභාවන්ට බඳවා නොගන්නා ලෙසයි. මේ අතර ඉදිරි පොහොර සහනාධාරයන් ආන්ඩුවේ වී අලෙවි මන්ඩලයට වී විකිනීම සමග බද්ධ කලයුතු බවට කෘෂිකර්ම අමාත්‍යවරයා නිවේදනය කර සිටියේය. බොහෝ දිළිඳු ගොවීන්ට ඔවුන්ගේ වී අස්වැන්න පුද්ගලික වෙලදුන්ට විකුනනු හැරුනු විට වෙනත් විකල්පයක් නැත. විදුලි ජනනය, සම්ප්‍රේෂනය හා බෙදා හැරීම, පුද්ගලීකරනය කිරීමේ දොරටු විවෘත වන අයුරින් මෙම මස මුලදී ආන්ඩුව විසින් පනතක් සම්මත කෙරිනි.

අපනයනකරුවෝ තමන්ගේ තරඟකාරීත්වය නංවා ගැනීම අරමුනු කොට රුපියල අවප්‍රමාන කිරීම ඇතුලුව, පියවර මාලාවක් වෙනුවෙන් බල කරමින් සිටිති. අපනයන වර්ධනය 2007 වසරේ සියයට 11 සිට 2008 වර්ෂයේ දී සියයට 6.5ක මට්ටමට කඩා වැටුනු අතර වසර අවසාන වන විට කඩා වැටීම උග්‍ර වෙමින් පැවතිනි. රටේ ප්‍රධාන අපනයනයන් ද්වය වන ඇඟලුම් සහ තේ අපනයනය දෙසැම්බර් මාසයේ දී , 2007 වසරේ දෙසැම්බර් මාසයට සාපේක්ෂව, පිලිවෙලින් 6.3%කින් සහ 22.5%කින් පහල වැටුනි. එක් අධ්‍යනයකට අනුව පසුගිය හය මාසයේදී ඇඟලුම් කර්මාන්ත ශාලා 24ක් වසා ඇතිබව සොයාගෙන තිබේ.

''කෙටි කාලීනව කම්කරුවන්ගේ සේවය අත්හිටුවීමට'' ඉඩ ලබා ගැනීමට ''කම්කරු නීති සැලකිය යුතු ප්‍රමානයකට ලිහිල් කිරීමට'' සහ වැඩ සතිය දින 5.5 සිට දින 5 දක්වා අවම කිරීමට ආන්ඩුව කැමති කරවා ගැනීමට දැනටමත් ලංකා ව්‍යවසායකයන්ගේ සංගමය විසින් සාකච්ඡා අරඹනු ලැබ ඇත. එමෙන්ම අතිකාල දීමනාවන්ගෙන් තොරව වැඩ දිනය පැය නවය දක්වා දීර්ඝ කිරීමට ලංකා ව්‍යවසායකයන්ගේ සංගමයට අවශ්‍ය වී තිබේ.

වැඩ කරන ජනතාව මත යුද්ධයේ ආර්ථික බර පටවනු ලැබූ මහින්ද රාජපක්ෂ ආන්ඩුව, එම ජනයා අතිශය ගැඹුරු වෙමින් පවතින දුප්පත්කමට සහ විරැකියාවට ඇද දමනු ලබන්නා වූ ජාමූඅහි නය මුදලක් ලබා ගැනීම මගින්, දිවයිනේ මූල්‍ය පද්ධතිය සහ මහ ධනපති පංතියට රැකුල් දීමේදී තමන් කිසිදු පැකිලීමක් නොදක්වන බව ඔප්පු කරනු ලැබ ඇත.



© www.wsws.org